**රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදල - 2019**

------------------------------------------------------------------------------------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

රේගු අතිකාල, නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්ෂණ සන්නිවේදන අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් හා වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන රේගු ආඥා පනතේ (235 වන අධිකාරිය) 103 (2) (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍යා කෙරේ.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

**-------------------------------------------------------------------------------------------**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ගනුදෙනු ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය, පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අරමුදලේ සමස්ථ ණයගැති ශේෂය වූ රු.125,457,248 න් සියයට 5 ක් හෙවත් රු.6,272,862 ක අඩමාණ ණය වෙන්කිරීමක් සිදු කර තිබූ අතර, මෙම ණයගැතියන්ගෙන් සියයට 42 ක්ම 2015 වර්ෂයේ සිට පැවත එන ශේෂයක් විය. ණය ගැතියන්ගේ පැවැත්ම හා ආයු කාලය පිළිබඳව සැළකිල්ලට ගැනීමකින් තොරව අඩමාණ ණය සඳහා පොදු රේටයක් නියම කර තිබුණි. | සමස්ථ ණයගැති ශේෂය වන රු.125,457,247 ක අගයෙන් රු.53,163,000 ක් 2015 වසරටද රු.1,763,642 ක මුදල 2018 වසරට ද ඉතිරිය වන රු.70,530,605 ක මුදල 2019 වසරට ද අදාල වේ. විගණන වාර්තාව මගින් පෙන්වා දී ඇති ණයගැතියන්ගෙන් සියයට 42 ක් 2015 වසරට පෙර පැවති අගය ලෙස දක්වා ඇත්තේ ශ්‍රී ලංකන් ගුවන් සමාගමෙන් 2015 වසර සඳහා ලැබිය යුතුව පවතින ඉහත දැක්වූ රු.53,163,000 ක අගයයි. 2015 වර්ෂයට අදාල ගුවන් ගමන් වේලා සටහන්වල පැවති දෝෂයන් නිසා මෙම හිඟ මුදල ශ්‍රී ලංකන් | ණයගැතියන්ගෙන් අයවීම් පිළිබඳව සැලකිල්ල යොමු කරමින් අඩමාණ ණය සඳහා පොදු රේටයක් නියම කළ යුතුය. |

ගුවන් සමාගම ගෙවා නොතිබූ අතර මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ නිලධාරීන් සමඟ එම වේලා සටහන් නැවත පරීක්ෂා කර අදාල ඉන්වොයිස් අගයන් නිවැරදි කර ගැනීම සිදු කරගනිමින් සිටි. එසේ නිවැරදි කර ගන්නා මාස සඳහා ක්‍රමක්‍රමයෙන් එම මුදල් ශ්‍රී ලංකන් ගුවන් සමාගම මඟින් ගෙවීම් සිදු කරමින් පවතී. (විගණන ඡේද අංක 02 යටතේ විස්තර දක්වා ඇත.) ඒ අනුව, මේ වන විට 2015 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි සහ මාර්තු සඳහා රු.12,303,000 ක් ගෙවා ඇත.

තවද, රේගු දෙපාර්තමේන්තුව වෙත ඇප තැන්පතු තබා නැව් සමාගම් සඳහා ණය පදනම මත සේවා සපයන බැවින් ගිණුම් වර්ෂයක් අවසානයේදී අදාල ගිණුම් වර්ෂයේ නොවැම්බර්, දෙසැම්බර් මාස සඳහා ගෙවීම් සිදු කිරීම ඉදිරි වසර ආරම්භක මාසයන්හිදී සිදු කිරීම නිසා සලකා බලනු ලබන ගිණුම් වර්ෂය අවසානයේදී එම වර්ෂයට අදාලව සැලකිය යුතු ණයගැති ශේෂයක් පෙන්නුම් කරයි.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට ආයතන 92 කින් අයවිය යුතුව පැවති එකතුව රු.125,457,248 ක් වූ ණයගැති ශේෂයෙන් සියයට 55 ක් එනම් රු.69,589,500 ක් ශ්‍රී ලංකන් එයාර් ලයින් සමාගමෙන් අරමුදලට අයවිය යුතුව පැවතුණි. මෙම හිඟ ණය අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මෙම වාර්තාවේ 1.5.2 ඡේදයට වූ පිළිතුර අදාල වේ. | මෙම සමාගම යාවජීව සාමාජිකයෙකු බැවින් අදාල ශේෂය කඩිනමින් අය කර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 1967 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල ආයතන 75 ක් විසින් ශ්‍රී ලංකා රේගුවේ තැන්පත් කර තිබූ රු.253,314 ක මුදල බාහිර ආයෝජනවල යෙදවීම තුලින් පොලී ආදායම රු.13,077,421 ක් උපයා ගැනීමෙන් සමස්ථ ආයෝජනය රු.13,330,735 ක් වී තිබුණි. මෙම ආයතනවල පැවැත්ම මෙන්ම වර්තමානයේදී සේවා සැපයීම පිළිබඳ කිසිදු විමර්ශනයක් සිදු නොකර අදාල ශේෂය වගකීම් සහ ආයෝජන ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | මෙම ආයතන 75 නමින් මේ වන විට සේවා සැපයීම් සිදු නොකරන බැවින් ඇප තැන්පතු විමර්ශනය සිදු කළ නොහැකි තත්ත්වයක් පවතින අතර මෙම ආයතනවල පැවැත්ම පිළිබඳව සමාගම් රෙජිස්ටාර්වරයාගෙන් විමසීමක් සිදු කර ඇත. කෙසේ වෙතත් ඉදිරියේදී මෙම මුදල ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ඇති හැකියාව සම්බන්ධයෙන් කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | වර්තමානයේදී සේවා සැපයීම හා ආයතනවල පැවැත්ම පිළිබඳ විමර්ශනය කර නිසි ගිණුම් තැබීමක් සිදු කිරීම හෝ අවශ්‍ය වෙනත් කටයුතු සිදු කළ යුතු බව. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) රේගු ආඥා පනතේ 103 වගන්තිය, 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය සහ 2002 දෙසැම්බර් 31 දිනැති අංක 218 (F) දරන අභ්‍යන්තර චක්‍රලේඛය | • සහකාර නිවාරණ නිලධාරී (වරාය අධිකාරී) විසින් බහාළුම් මෙහෙයුම් පිළිබඳ දත්ත දෛනිකව ගණකාධිකාරී (අතිකාල) වෙත ඉදිරිපත් කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි . | • සහකාර නිවාරණ නිලධාරී (වරාය රාජකාරී) මගින් දෛනිකව රැස් කරන අතිකාල වාර්තා දෛනිකව ගණකාධිකාරී (අතිකාල) වෙත යැවීම හා පරීක්ෂා කිරීම ප්‍රායෝගිකව ගැටළු සහගත වේ. | අණපනත් සහ චක්‍රලේඛ කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු බව. |
| | • අතිකාල ලැබීම් හිඟහිටීම් වලකා ගැනීම සඳහා බිල්පත් යාවත්කාලීනව නිකුත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | • අතිකාල ලැබීම් හිඟ හිටීම බොහෝ දුරට අවම කිරීමට කටයුතු කර ඇත. | අණපනත් සහ චක්‍රලේඛ කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු බව. |
| | • නෞකා නියෝජිතයන්ගේ තොරතුරු ශ්‍රී ලංකා වරාය අධිකාරියේ දත්ත සමඟ පරීක්ෂා කර තහවුරු වාර්තාවක් ප්‍රධාන නිවාරණ නිලධාරී විසින් ගණකාධිකාරී (අතිකාල) වෙත ලබා දී නොතිබුණි. | • මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අදාල අංශ දැනුවත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | අණපනත් සහ චක්‍රලේඛ කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු බව. |
| | | | අභ්‍යන්තර චක්‍රලේඛ |

| | | |
|---|---|---|
| • බහාළුම් මෙහෙයුම් තොරතුරුවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම ශ්‍රී ලංකා රේගුවේ වරාය පාලන ඒකකය විසින් සිදු කරනු ලැබුවද ඒ සඳහා නීත්‍යානුකූල කාර්ය පැවරීමක් හෝ තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදයක් නොපැවතුණි. | • මේ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අදාල අංශ දැනුවත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. | කෙරෙහි දැඩි අවධානය යොමු කර තත්ත්වය විධිමත් කිරීම සඳහා කටයුතු කළ යුතු වීම. |
| • නෞකා නියෝජිත ආයතනවලින් ලබාගන්නා රු.100,000 ක් වූ තැන්පතු සුදුසු ආයෝජන මාර්ගයක ආයෝජනය කර පොලී ආදායමින් රජයට අයවිය යුතු කොටස හඳුනාගෙන ඉතිරිය තැන්පත්කරුට ගෙවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා රේගුව විසින් නාවික කටයුතුවලට අදාලව නැවේ දේශීය නියෝජිතයා හෝ නැව අයත් සමාගමේ දේශීය නියෝජිතයාගෙන් රු.100,000 ක තැන්පත් මුදලක් ලබාගනු ලැබේ. මෙසේ ලබාගන්නා තැන්පතු මුදල් මහාභාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක 1/128 දරන තැන්පත් ගිණුම යටතේ ගිණුම්ගත කරනු ලබයි. එමෙන්ම මෙසේ ලබා ගන්නා මුදල් එදිනම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුම් ජාලය යටතේ රේගු අධ්‍යක්ෂ ජනරාල් නමින් පවත්වාගෙන යන මහජන බැංකුවේ අංක 00110129026664 දරන ගිණුමට බැර වේ. ඒ අනුව මෙම ගිණුම යටතේ ඒකරාශී වන මුදල් මහා භාණ්ඩාගාරයේ බැංකු අයිරාව සඳහා ගෙවන පොලිය අවම කර ගැනීමට පහසුකමක් සලසයි.<br>තවද මෙම ඇප බැඳුම්කරය වාර්ෂිකව අළුත් කරමින් එම නැව් සමාගම් සේවා ලබා ගන්නා අතර ඔවුන්ට අවශ්‍ය අවස්ථාවලදී (සේවා ලබා ගැනීම නවතා දැමූ විට) මෙම ඇපකරය නැවත ලබාදිය යුතු වේ. එබැවින් රැස් කර ගන්නා ඇප තැන්පතු සියල්ල ආයෝජන මාර්ගයක යෙදවීම ප්‍රායෝගික නොවන බව කාරුණිකව දන්වා සිටිමි. | අභ්‍යන්තර චක්‍රලේඛ කෙරෙහි දැඩි අවධානයක් යොමු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) 2017 අප්‍රේල් 19 දිනැති අංක 2017/3 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සියළුම රාජ්‍ය සේවකයන් සිය පැමිණීම හා පිටවීම සටහන් කිරීම වෙනුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කළ යුතු වුවද ශ්‍රී ලංකා රේගුවේ සේවයේ නියුතු රජයේ නිලධාරීන් කිසිවකු එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා අතිකාල ලෙස ගෙවා තිබූ මුදල රු.920,836,747 කි. | පැමිණීම හා පිටවීම ලකුණු කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර සවි කිරීමට කටයුතු කරමින් පවතී. | රාජ්‍ය අංශයේ සියළුම නිලධාරීන්ට අදාල පොදු චක්‍රලේඛ අනුව රේගු කාර්ය මණ්ඩලයද කටයුතු කළ යුතු බව. |
| (ඇ) 2016 දෙසැම්බර් 22 දිනැති අංක PF/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.2 (ආ) ඡේදය | අතිකාල අරමුදල තුල ආයෝජන ලෙස රු.13,330,735 ක මුදලක් සහ භාණ්ඩාගාර අරමුදල ලෙස රු.2,233,422,822 ක මුදලක් දීර්ඝ කාලයක සිට සමුච්චිත වෙමින් පැවතියද, චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව එම අතිරික්ත මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. | 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන ගැසට් පත්‍රය ප්‍රකාර රේගු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් රාජකාරි වේලාවෙන් බැහැරව ඉටු කරනු ලබන සේවා සඳහා ගාස්තු හෝ අයකිරීම් වශයෙන් අය කරනු ලබන සියලුම මුදල් තැන්පත් ගිණුම් අංක 6000-0-0-6-32 දරන රේගු අතිකාල , නැව් බඩු පරීක්ෂා කිරීමේ ගාස්තු සහ රේගු තොරතුරු හා තාක්‍ෂණ සන්නිවේදන අරමුදල් ගිණුමට බැර කර ඇති අතර මෙහි පරිපාලන බලධාරියා වන්නේ රේගු අධ්‍යක්ෂ ජනරාල්ය. වාර්ෂිකව අතිකාල ලෙස එකතු වන ලැබීම්වලින් සියයට 10 ක් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කර ඉතිරි සියයට 90 ක මුදල් ප්‍රමාණය රේගු නිලධාරීන් සඳහා ගෙවනු ලබයි. තව ද ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදය අනුව අතිකාල ලෙස එකතුවන ගාස්තුවලින් සියයට 10 ක් ඒකාබද්ධ අරමුදලට බැර කර ඉතිරිය නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා ගැනීමට ඉඩ දිය හැක. මේ ආකාරයට කටයුතු කිරීම තුළ වඩා හොඳ සේවක තෘප්තියක් ඇතිවීම මගින් ඔවුන් වැඩිපුර සේවය වෙනුවෙන් කැපවීම නිසා දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාවය වැඩි වීමට හේතු වේ. එමෙන්ම මෙම අරමුදලේ පවතින්නේ ඒකාබද්ධ අරමුදලට සියයට 10 ක් බැර කළ පසු ඉතිරි වී | අදාල චක්‍රලේඛයට අනුව සමුච්චිත වෙමින් පවතින අතිරික්ත මුදල් භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කර සුදුසු වැඩ පිළිවෙලක් යෙදීම. |

පවතින මුදල් නිසා 2016 දෙසැම්බර් 22 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/423 ප්‍රකාරව කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් පැනනොනගින බව කාරුණිකව දන්වා සිටිමි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 55,141,127 ක ඌණතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.334,904,166 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.390,045,293 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඒ සඳහා පහත කරුණු බලපා තිබූ බව නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළ රේගු අතිකාල ආදායම් වර්ධනය කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර අතිකාල සමාලෝචන කමිටු තීරණයකට අනුව 2018 ඔක්තෝබර් 01 දින සිට පැයකට ගෙවනු ලබන අතිකාල ගෙවීම් සියයට 50 කින් වැඩි කර තිබුණි.

(ආ) නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරුන් සඳහා පැයකට ගෙවනු ලබන අතිකාල දීමනාව රු.81.24 දක්වා වැඩි කිරීමත්, සියලුම රේගු අධ්‍යක්ෂවරුන් සඳහා පැය 600 ක අතිකාල දීමනාවක් ගෙවීමටත්, අංශ 07 ක සහකාර රේගු අධිකාරීවරුන් සඳහා ද පැය 600 ක් දක්වා අතිකාල ගෙවීමටත් අතිකාල සමාලෝචිත කමිටුව විසින් තීරණය කර තිබීම අරමුදලේ ඌනතාවයක් ඇති වීමට බෙහෙවින් බලපා තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

---------------------------------------------------------------

රේගු ආඥාපනතේ 103 වගන්තිය අනුව නිකුත් කරන ලද 2007 ඔක්තෝබර් 26 දිනැති අංක 1520/17 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව, නිලධාරීන් විසින් සාමාන්‍ය රාජකාරී වේලාවන්වලින් පරිබාහිර වේලාවන්වලදී කරනු ලබන රාජකාරි වෙනුවෙන් සහ සාමාන්‍ය රාජකාරී ස්ථානවලින් පරිබාහිර ස්ථානවලදී ඉටුකරනු ලබන රාජකාරි සඳහා ඊට අදාල පාර්ශවයන්ගෙන් අයකරනු ලබන ගාස්තු හා අයකිරීම්ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට තාක්ෂණික සේවා සැපයීම වෙනුවෙන් එම ආයතනයෙන් අයකරනු ලබන ගාස්තුද අරමුදලට බැර කළයුතු වේ. එසේම, එම අතිරේක රාජකාරී වෙනුවෙන් නිලධාරීන්ට කරනු ලබන ගෙවීම් මෙම අරමුදලේ වැය බරක් සේ සලකනු ලැබේ. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ඉහත සඳහන් පරිදි අතිකාල, නැව්බඩු පරීක්ෂණ හා තොරතුරු තාක්ෂණ කටයුතු වෙනුවෙන් පිළිවෙලින් රු.954,715,434 ක්, රු.309,047,969 ක් හා රු.14,976,000 ක් රැස්කර තිබූ අතර එම වැඩ කටයුතුවල නිරත වූ නිලධාරීන්ට පිළිවෙලින් අතිකාල ආදායමෙන් සියයට 96 ක් ලෙස රු.920,836,747 ක්, නැව් බඩු පරීක්ෂණ ආදායමෙන් සියයට 50 ක් ලෙස රු.154,523,984 ක් හා තොරතුරු තාක්ෂණ ආදායමෙන් සියයට 80 ක් ලෙස රු.11,980,800 ක් ගෙවා තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

-----------------------

පෙර වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 6.08 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ එම අනුපාතය 5.98 ක් විය. ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම් අනුපාතය 0.1 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නිලධාරීන් දිනපතා අඛණ්ඩව පැය 24 ක් පුරා සේවයේ යෙදවීම ඉතාම අසාමාන්‍ය තත්ත්වයක් වුවද, රේගු දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරීන් වර්ෂයක් පුරා අඛණ්ඩව දිනකට පැය 24 බැගින් සේවයේ යෙදවූ බවට වාර්තා කර අතිකාල ගෙවා තිබුණි. | අතිකාල ගෙවීමේ ක්‍රමවේදය සංශෝධනය කිරීම පිළිබඳව අධ්‍යයනය කරමින් පවතින අතර, පැමිණීම හා පිටවීම ලකුණු කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර සවි කිරීමට කටයුතු කරමින් පවතී. | අතිකාල ගෙවීමේදී අධීක්ෂණ නිලධාරීන්ගේ දැඩි අධීක්ෂණයක් සිදු විය යුතු බව. |
| (ආ) අතිකාල අරමුදලේ ගෙවීම් විධිමත් පාලනයක් යටතේ සිදු නොවන බව ඉකුත් විගණන වාර්තාවල අඛණ්ඩව පෙන්වා දී තිබුණද, මෙම තත්ත්වය විධිමත් කිරීම සඳහා මේ දක්වා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් රේගු ආඥා පනතේ 103 වගන්තියේ විධිවිධාන, මේ දක්වා නිකුත් කරන ලද දෙපාර්තමේන්තු නියෝග සහ අතිකාල කමිටුවේ නිර්දේශ මත ක්‍රියාකර ඇත. කෙසේවුවද, අතිකාල ගෙවීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳ දෙපාර්තමේන්තුවේ අවධානය යොමු වී ඇත. | මෙ පිළිබඳව පවත්නා නීතිරීති අනුව විධිමත් පරීක්ෂණයක් සිදු කළ යුතු බව. |
| (ඇ) අතිකාල ගෙවීම් සංශෝධනය කිරීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ හා මුදල් අමාත්‍යාංශයේ එකඟතාවයක් ලබා ගත යුතු වුවද, එසේ නියමිත පරිදි එකඟතාවය ලබා ගැනීමකින් තොරව අතිකාල සමාලෝචන කමිටුව නමින් වූ අභ්‍යන්තර කමිටුවක තීරණ මත අවස්ථා 04 කදී අතිකාල ගෙවීම් සංශෝධනය කර තිබුණි. | රේගු දෙපාර්තමේන්තුව තුළ අතිකාල ගෙවීම් නැවත සමාලෝචනය කර අතිකාල ගෙවීම් සඳහා වන නව ක්‍රමවේදයක් සකස් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු වී ඇත. | අතිකාල ගෙවීමේදී අධීක්ෂණ නිලධාරීන් මඟින් දැඩි අධීක්ෂණයක් සිදු විය යුතු බව. |
| (ඈ) සමාලෝචිත වර්ෂය සඳහා රාජ්‍ය දායකය (සියයට 10 ක්) අඩු කළ පසු අතිකාල ආදායම් ලෙස රු.859,244,971 ක් රැස් කර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ එම අරමුදලින් සිදුකර ඇති වියදම රු.914,386,098 ක් වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අතිකාල | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. | ප්‍රායෝගික තත්ත්වයන් සැලකිල්ලට ගෙන නිසි අධීක්ෂණයක් හා විධිමත් අනුමැතියක් යටතේ අතිකාල ගෙවීම් සිදුකළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | අරමුදලේ ඌණතාවය රු.55,141,127 ක් වී තිබුණි. එම ඌණතාවය පියවා ගැනීම සඳහා ඉකුත් වර්ෂය තුල අරමුදලේ පැවති සමුච්චිත ශේෂයන් උපයෝජනයට ගෙන තිබුණි. | | |
| (ඉ) | ගාස්තු හා අයකිරීම් රේටයන් සංශෝධනය කිරීමට කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබූ අතර, අභ්‍යන්තර කමිටුවක තීරණයකට අනුව 2018 ඔක්තෝබර් 01 දින සිට පැයකට ගෙවනු ලබන අතිකාල ගෙවීම් සියයට 50 කින් වැඩි කර තිබුණි. ඒ අනුව නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂවරුන් සඳහා පැයකට ගෙවනු ලබන අතිකාල දීමනා අනුපාතය වැඩි කිරීමත්, සියළුම රේගු අධ්‍යක්ෂවරුන් සඳහා මසකට පැය 600 ක අතිකාල දීමනාවක් ගෙවීමටත් සහ අංශ 07 ක සහකාර රේගු අධිකාරීවරුන් සඳහා මසකට පැය 600 ක් දක්වා වූ අතිකාල දීමනාවක් ගෙවීමටත් අතිකාල සමාලෝචන කමිටුව විසින් තීරණය කර තිබීම මෙම අරමුදලේ ඌණතාවයක් ඇති වීමට බෙහෙවින් බලපා තිබුණි. මෙලෙස රේගු කාර්ය මණ්ඩලයට දීමනා වැඩි කර ගෙවීම සඳහා ලබාගෙන ඇති නිශ්චිත අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවීය. | විගණන නිරීක්ෂණ සමඟ එකඟ වෙමි. | ප්‍රායෝගික තත්ත්වයන් සැලකිල්ලට ගෙන නිසි අධීක්ෂණයක් හා විධිමත් අනුමැතියක් යටතේ අතිකාල ගෙවීම් සිදුකළ යුතුවීම. |